**සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**සබරගමුව පළාත් සභා සංකීර්ණය, නවනගරය, රත්නපුර.**
**சப்பிரகமுவ மாகாண சபை அரச சேவை ஆணைக்குழு**
சப்பிரகமுவ மாகாண சபைக் கட்டிடத் தொகுதி, புதிய நகரம் இரத்தினபுரி.
**Sabaragamuwa Provincial Public Service Commission**
**Sabaragamuwa Provincial Council Complex, New Town, Ratnapura.**


මගේ අංකය / ஏனது இல / My No : PPSC/ES/05/FI/12/46

ඔබේ අංකය / உமது இல / Your No :

දිනය / திகதி / Date : 2026.07. 20

සබරගමුව පළාත් සභාවේ,

01. ප්‍රධාන ලේකම්
02. ආණ්ඩුකාර ලේකම්
03. සභා ලේකම්
04. සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු
05. දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් පාලන ආයතන ලේකම්වරු

**සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන්හට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සහන කාලයක් ලබා දීම.**

උක්ත කරුණට අදාළව නිකුත් කර ඇති මගේ සමාංක හා 2020.09.04 දිනැති සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සහන කාලයක් ලබා දීම වෙනුවෙන් නිකුත් කරන ලද සහ 2023.04.10 දිනැති සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී සේවයේ II හා I ශ්‍රේණිවල නිලධාරීන්හට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා සහන කාලයක් ලබා දීම වෙනුවෙන් නිකුත් කරන ලද ලිපි හා යොමු වේ.

02. ඒ අනුව සේවා ව්‍යවස්ථාවට අනුකූලව පැවැත්වීමට නියමිත අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග අවස්ථා සංඛ්‍යාවට සමාන අනුයාත විභාග අවස්ථාවන් තුළ දී එම විභාග සම්පූර්ණ කර ඇති නිලධාරීන්හට ඉහත යොමුගත ලිපිවල සඳහන් කර ඇති පරිදි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන් සමත්වීම සඳහා සහන කාලයක් ලබා දී තිබුණ ද, ඇතැම් කළමනාකරණ සේවා නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු පරීක්ෂා කිරීමේ දී අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය එකී සහන කාලය තුළ සම්පූර්ණ කර ඇති බවට වන ලිපි අදාළ ආයතන ප්‍රධානීන් විසින් ඇතුළත් කර නොමැති බවට නිරීක්ෂණය විය.

03. එබැවින් ඉහත යොමු ගත ලිපි මගින් ලබා දී ඇති සහන කාලය තුළ අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්පූර්ණ කරන ලද කළමනාකරණ සේවා නිලධාරීන් ඔබ කාර්යාලයේ සේවය කරන්නේ නම් ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනුවලට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය නියමිත සහන කාලය තුළ දී සම්පූර්ණ කර ඇති බවට වන ලිපි ඇතුළත් කර තැබීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

04. ඔබගේ පහසු අවධානය සඳහා 2004.01.01 දිනට පසු කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I, II හා III ශ්‍රේණිවලට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වන ලද දිනයන් පහත පරිදි වන බවත් ඉදිරියේදී පැවැත්වීමට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වනු ලබන දිනයන් මෙම කාර්යාලයේ වෙබ් අඩවිය තුළින් යාවත්කාලීන කරන බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.


ලේකම් / செயலாளர் / Secretary - 045-2223227
කාර්යාලය / அலுவலகம் / Office - 045-2222379
ෆැක්ස් / பெக்ஸ் / Fax - 045-2121175
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E Mail - ppsc_spc@sltnet.lk

| කළමනාකරණ සේවා නිලධාරී I ශ්‍රේණිය (2013.04.02 දින සිට නව සේවා ව්‍යවස්ථාව අනුමත කිරීමෙන් පසු) | කළමනාකරණ සේවා නිලධාරී II ශ්‍රේණිය | කළමනාකරණ සේවා නිලධාරී III ශ්‍රේණිය |
|---|---|---|
| 2015.09.12 | 2007.03.31 | 2007.03.31 |
| 2017.04.21 | 2007.12.08 | 2008.08.30 |
| 2019.11.30 | 2008.10.25 | 2009.07.26 |
| 2021.11.20 | 2009.11.21 | 2010.07.17 |
| 2023.11.25 | 2010.11.13 | 2011.10.01 |
| 2025.11.22 | 2011.12.24 | 2013.01.27 |
| | 2013.03.16 | 2014.06.29 |
| | 2014.05.10 | 2015.09.19 |
| | 2015.05.23 | 2017.05.20 |
| | 2017.04.01 | 2018.10.28 |
| | 2018.03.17 | 2020.09.27 |
| | 2019.12.21 | 2022.11.19 |
| | 2023.06.24 | 2024.07.27 |
| | 2025.10.26 | |
| | 2026.05.10 | |

එස්.පී.කේ. බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත් සභාව

එස්.පී.කේ. බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.